රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2026

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CAD/MOH/CM/Vol.V හා 2026.09.23 දිනැති ලිපිය හා අංක 2199/10 හා 2020.10.27 දිනැති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාව හා සංශෝධනවලට අනුකූලව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි පුරප්පාඩු තනතුරු 177 ක් සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

ඒ අනුව මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් 2026 නොවැම්බර් මස 16 දිනට සපුරාලන සුදුස්සන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ආයුර්වේද කොමසාරිස් ජනරාල්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ **''ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2026"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. තව ද, බඳවා ගැනීමේ අයදුම්පත්‍රයේ සඳහන් කරන නම සිංහල මාධ්‍ය අයදුම්කරුවන් විසින් සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි බසින් ද, දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් විසින් දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි බසින් ද සඳහන් කළ යුතු ය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026 නොවැම්බර් මස 16 දින වේ.

සටහන : අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම විඳදරා ගත යුතු ය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආයුර්වේද/ සිද්ධ/ යුනානි උපාධිය ලත් උපාධිධාරීන් අදාළ වර්ෂවල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන කුසලතා ලේඛනයේ අනුපිළිවෙල පදනම් කරගෙන බඳවාගනු ලැබේ. වසර කිහිපයකට අදාළ උපාධිධාරීන් අයදුම්කරුවන් ලෙස ඉදිරිපත් වන අවස්ථාවක දී ඒ ඒ වර්ෂයන්හි කුසලතා ලේඛනය පදනම් කර ගනිමින් එම කුසලතා ලේඛනයෙහි සඳහන් අනුපිළිවෙලට ප්‍රමුඛතාවය දෙමින් පත්කිරීම් බලධරයා විසින් පත් කරන ලද සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

02. බඳවා ගන්නා ශ්‍රේණිය : ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණිය

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු ය.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමෙන් පසු උසස් කිරීම් සිදුකරනුයේ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට අනුකූලව ය.

III. නවක පත්වීම්ලාභීන් ඔවුන්ගේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු පවතින සේවා ස්ථාන වෙත ස්ථානගත කරනු ලබන අතර, මුල් පත්වීම අනුව වැඩ භාරගත් නිලධාරීන් සිය මුල් සේවා ස්ථානයේ අනිවාර්ය වසර දෙකක (02) සේවා කාලය අවසන් වන තෙක් සේවය කළ යුතු ය. එම කාලය තුළ ස්ථාන මාරුවීම් අපේක්ෂා නොකළ යුතු අතර මෙම කාලය තුළ ස්ථාන මාරු ලබා දීමට ද කටයුතු නොකෙරේ.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, අංක 2199/10 හා 2020 ඔක්තෝබර් මස 27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඇතුළත් නියමයන් සහ කොන්දේසි වලට ද, රජයේ මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

04. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රු. 91,750-3x2,400-7x2,420- 2x2,490-16x3,900- රු. 184,170/- (SL-2-2025) මාසික වැටුප් පරිමාණයක් හිමි ය.

05. වයස් සීමාව : 2026 නොවැම්බර් මස 16 දිනට

අවම සීමාව : අවුරුදු 22යි
උපරිම සීමාව : අවුරුදු 45යි

06. සුදුසුකම් :

I. අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආයුර්වේද / සිද්ධ/ යුනානි වෛද්‍ය විද්‍යාව පිළිබඳ පස් අවුරුදු උපාධියකින් පසුව එක් අවුරුදු සීමාවාසික රෝහල් පුහුණුවක් ලබා තිබීම.

II. වෘත්තීය සුදුසුකම් : ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ලබා තිබීම.

III. පළපුරුද්ද : අදාළ නොවේ.

IV. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම පුදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු යි.

V. වෙනත් සුදුසුකම් :

- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉල්ලා සිටින විටෙක ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානම්ව සිටිය යුතු ය:-

(i) උප්පැන්න සහතිකය;
(ii) සවිස්තරාත්මක උපාධි සහතිකය;
(iii) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය;
(iv) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය;
(v) ජාතික හැඳුනුම්පත.

08. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක් වේ. අයදුම්පත්‍රය සෙ. මී. 22x29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, අංක 01 සිට 08 තෙක් ශීර්ෂ පළමු පිටුවට ද, අංක 09 සිට

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

11 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අදාළ අයදුම්පත්‍රයේ ආකෘතියක් www.ayurveda.gov.lk මගින් ද ලබා ගත හැක.

09. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් සාවද්‍ය බවට බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.

එබඳු සාවද්‍ය තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව වුව ද අනාවරණය වුවහොත් ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව සතු වේ.

11. මෙම නිවේදනයෙහි විධිවිධාන සැලසී නොමැති කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

12. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියෝගය පරිදි,

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 17 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

Gazette.lk AMBITIONS REALIZED